᳓ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2160/44 - 2020 ජනවාරි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් (2019 අප්‍රේල් මස 30 වන දින අංක 2121/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2009 මැයි මස 28 වන දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනය එහි I වන තීරයේ දැක්වෙන ''තාක්ෂණ පීඨය'' යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන ''3. ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය'' යන සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් සටහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''3. ද්‍රව්‍ය සහ යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයන අංශය
4. සිවිල් සහ පාරිසරික තාක්ෂණ අධ්‍යයන අංශය
5. තාක්ෂණය සඳහා විද්‍යාව අධ්‍යයන අංශය''.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

02 - 274

1A - PG 4860 — 518 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*